# ලංසු ආරාධනයයි

## ගොඩනැගිලි දෙපාර්තමේන්තුව
## නැගෙනහිර පළාත

01. දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් පහත සඳහන් ශ්‍රේණි සඳහා ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය **CIDA ලියාපදිංචිය** ඇති යෝග්‍යතාපූර්ණ ලංසුකරුවන්ගෙන් පහත සඳහන් කාර්යය සඳහා මුද්‍රාතබන ලද ලංසුපත් කැඳවනු ලැබේ.

02. **ප්‍රසම්පාදන ක්‍රමය ජාතික තරඟකාරී ලංසුකරණයයි. එසේ වුවද ලංසුකරුවන් නැගෙනහිර පළාත් පරිපාලන සීමාව තුල විය යුතුය**

03. ලංසුපත් ලියකියවිලි 2017.10.24 දින ප.ව.3.00 දක්වා පහත වගුවේ සඳහන් පරිදි ආපසු නොගෙවන ගාස්තු මුදල වගුවේ සඳහන් පරිදි **ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ඉංජිනේරු කාර්යාලය වෙත** ගෙවීමෙන් පසු ලබාගත් ලදුපත **ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ විධායක ඉංජිනේරු වෙත** ඉදිරිපත්කිරීමෙන් පසු මිල දී ගත හැක.

04. ලංසුකරුවන් හට ලංසුපත් ලියකියවිලි පිටපත් දෙකකින් යුතුව ලබා ගැනීමේ හැකියාව ඇත. මේ සම්බන්ධයෙන් උනන්දුවක් දක්වන ලංසුකරුවන් හට ලංසුපත් ලියකියවිලි ලබා ගැනීමට පෙර නොමිලේ එම ලේඛන පරීක්ෂා කිරීමට හැකි අතර, **වැඩිදුර විස්තර අවශ්‍ය වන්නේ නම් අදාල ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ විධායක ඉංජිනේරු කාර්යාලය** යන ලිපිනයෙන් ලබා ගත හැක.

05. සම්පූර්ණ කරන ලද ලංසුපත් ලියකියවිලි පහත වගුවේ සඳහන් මුදල් සඳහා ලංසු ඇපකරයක් සමග **සභාපති, දෙපාර්තමේන්තුවේ ප්‍රසම්පාදන කමිටුව, පළාත් අධ්‍යක්ෂක කාර්යාලය, ගොඩනැගිලි දෙපාර්තමේන්තුව, ඇතුළු වරාය පාර, ත්‍රිකුණාමලය** යන ලිපිනයට **2017.10.25 දින ප.ව. 2.30** හෝ ඊට පෙර ලැබෙන සේ එවිය යුතුය. ලංසුපත් භාරගැනීම අවසන් වූ වහාම මේ සඳහා පැමිණෙන ලංසුකරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයන් ඉදිරිපිට දී ලංසුපත් **ත්‍රිකුණාමලය, ඇතුළු වරාය පාර, ගොඩනැගිලි දෙපාර්තමේන්තුව, පළාත්අධ්‍යක්ෂක කාර්යාලයේදී** විවෘත කිරීම සිදු කරනු ලැබේ. ප්‍රමාද වී ලැබෙන ලංසුපත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

06. පෙර ලංසු කැඳවීමේ රැස්වීමක් අදාල ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ඉංජිනේරු කාර්යාලයේ දී 2017.10.17 වන දින පෙ.ව. 10.00 ට පවත්වනු ලැබේ.

07. කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමේ අවසන් තීරණය ප්‍රසම්පාදන කමිටුව සතුය.

<u>වගුව</u>

| කාර්යයේ නම | CIDA ශ්‍රේණිය (ගොඩනැගිලි) | ඉදිකිරීම් පිරිවැය (රුපියල්) | කොන්ත්‍රාත් කාල සීමාව | ආපසු නොගෙවන ගාස්තු (රුපියල්) | ලංසු වලංගු තාවය | ප්‍රාදේශිය කාර්යාලය | ලංසුඇපකරය | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | මුදල (රුපියල්) | වලංගු කාල සීමාව |
| ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ නිලාවෙලි ප්‍රදේශයේ කෘෂිකර්ම ව්‍යාප්ති භාරදීමේ සේවා මධ්‍යස්ථානය ඉදිකිරීම | C5 සහ C6 | මිලියන 10.319 | මාස 06යි | 4,000.00 | දින 77යි | ත්‍රිකුණාමලය දු. ක. අ 026 -2222387 | 104,000.00 | දින 105යි |
| අම්පාර දිස්ත්‍රික්කයේ මහඔය ප්‍රදේශයේ කෘෂිකර්ම ව්‍යාප්ති භාරදීමේ සේවා මධ්‍යස්ථානය ඉදිකිරීම | C5 සහ C6 | මිලියන 10.409 | මාස 06යි | 4,000.00 | දින 77ය | කල්මුණෙ දු. ක. අ 067 -2229153 | 105,000 .00 | දින 105යි |
| මඩකලපුව දිස්ත්‍රික්කයේ වවුනතිවු ප්‍රදේශයේ කෘෂිකර්ම ව්‍යාප්ති භාරදීමේ සේවා මධ්‍යස්ථානය ඉදිකිරීම | C5 සහ C6 | මිලියන 10.264 | මාස 06යි | 4,000.00 | දින 77ය | මඩකලපුව දු. ක. අ 065 -2222910 | 103,000 .00 | දින 105යි |
| ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ මුතූර් ප්‍රදේශයේ අක්කරච්චෙනයි රාවල්ත්තුල් අත්ෆාල් අනාථාගාරය ඉදකිරීම | C7 | මිලියන 6.737 | මාස 02යි | 3,000.00 | දින 77ය | ත්‍රිකුණාමලය දු. ක. අ 026 -2222387 | 67,500 .00 | දින 105යි |

පළාත් අධ්‍යක්ෂක ඉංජිනේරු
ගොඩනැගිලි දෙපාර්තමේන්තුව
නැගෙනහිර පළාත
ඇතුළු වරායපාර
ත්‍රිකුණාමලය
දුරකථනඅංකය 026-2222630
දිනය 2017.09.30

කේ.චන්ද්‍රමෝහන්
සභාපති
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව